සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

| 29 | S | I |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................ **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I** කාලය පැය දෙකයි

- **අංක 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා නියමිත අංකයේ කතිරයක් (x) යොදන්න.**

01. ජනමාධ්‍ය පාසල්, සන්නිවේදන පර්යේෂණ ආයතන වැනි සන්නිවේදන ආයතන ආරම්භ කිරීම සඳහා පුරෝගාමී වූයේ,
    1. හැරල්ඩ් ඩී. ලැස්වෙල්ය.
    2. කාල් හවුලන්ඩ්ය.
    3. ජෝජ් ගාබ්නර්ය.
    4. ක්ලෝඩ් ෂැනෝන්ය.
    5. විල්බර් ශ්‍රාම් ය.

02. චාල්ස් හෝර්ටන් කූලි, වෝල්ටර් ලිප්මාන්, ජෝන් ඩූවී යන විද්වතුන් විසින් සම්පාදනය කළ කෘති පිළිවෙලින් දැක්වෙන්නේ,
    1. සමාජ සංවිධානය, ජනහඬ හා ඔවුන්ගේ ගැටලු, ජනමතය
    2. ජනමතය, සමාජ සංවිධානය, ජනතාව හා ඔවුන්ගේ ගැටලු
    3. සමාජ සංවිධානය, ජනමතය, ජනතාව හා ඔවුන්ගේ ගැටලු
    4. ජනමතය, සන්නිවේදන ශබ්දාකරය, සමාජ සංවිධානය
    5. සන්නිවේදන ශබ්දාකරය, ජනමතය, සමාජ සංවිධානය

03. අන්තර්පුද්ගල සන්නිවේදනය දෛනික ජීවිතයේ අත්‍යවශ්‍ය සන්නිවේදන අවස්ථාවක් වන්නේ අනෙකුත් සන්නිවේදන වර්ගයන්ට සාපේක්ෂව,
    1. කිසියම් මතයක් නිර්මාණය කිරීමට අති හැකියාව නිසාය.
    2. පෙළඹවීමේ හැකියාව වැඩි නිසාය.
    3. ප්‍රතිරූප ගොඩනංවා ගැනීමට උදව්වන නිසාය.
    4. සමාජීය පොදු කාර්යවල දී ඉවහල්වන නිසාය.
    5. විවිධ පාර්ශවවල අවධානය දිනා ගැනීමට හැකිවන නිසාය.

04. ලිඛිත මධ්‍යයේ වර්ධනයට පෙර 'සාක්ෂරතාව' ලෙස හැඳින්වූයේ,
    1. භාෂාමය හැකියාවයි.
    2. දෘශ්‍ය සන්නිවේදන නිපුණතාවය යි.
    3. ශූර කථිකත්ව හැකියාවයි.
    4. සාමාන්‍ය ලේඛන හැකියාවයි.
    5. කථික සහ ලිඛිත හැකියාවයි.

05. සමාජීය සත්ත්වයෙකු ලෙස මිනිසාට සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය ශාස්ත්‍රීය වශයෙන් හැදෑරීම වැදගත් වන්නේ,
    1. ජාතික සහ ජාත්‍යන්තර සන්නිවේදන ක්‍රියාදාමයන් අවබෝධ කර ගැනීම සඳහා ය.
    2. සමාජ ප්‍රගමනයට සක්‍රිය දායකත්වය ලබා දීම සඳහා ය.
    3. ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ පුද්ගලයෙකුට අවබෝධය ලබා දීම සඳහා ය.
    4. යහපත්, ආචාරශීලී සහ ඵලදායී අන්තර් සබඳතා ගොඩනගා ගැනීම සඳහා ය.
    5. මාධ්‍ය සාක්ෂරතාව ලබා ගැනීම සඳහා ය.

06. ප්‍රසිද්ධ රැස්වීම්, ප්‍රසිද්ධ දේශන හා විවිධ සැමරුම් උත්සව අයත් සන්නිවේදන වර්ගය වන්නේ,

1. අතථ්‍ය සන්නිවේදනයයි.
2. ජන සන්නිවේදනයයි.
3. මහජන සන්නිවේදනයයි.
4. සමූහ සන්නිවේදනයයි.
5. අන්තර් පුද්ගල සන්නිවේදනයයි.

07. මහජන සම්බන්ධතාවය සඳහා ද්විමාර්ගිකව භාවිතා කළ හැකි නව මාධ්‍ය මෙවලම් සහිත වරණය වන්නේ,

1. ඡායාරූප, වාර්ෂික වාර්තා, ශ්‍රව්‍ය මාධ්‍ය
2. විද්‍යුත් මාධ්‍ය කට්ටල, පොත් පිංච, වාර සටහන්
3. සමාජජාල, වෙබ් අඩවි, ඡායාරූප
4. වීඩියෝ සම්මන්ත්‍රණ, විද්‍යුත් තැපැල, විද්‍යුත් මාධ්‍ය කට්ටල
5. දැන්වීම්, පෝස්ටර්, විද්‍යුත් මාධ්‍ය මධ්‍යස්ථාන

08. බොහෝ පුද්ගල හා සමාජ ගැටලු අවම කිරීමට බලපානු ලබන්නේ,

1. ආගමික පුනරුදයක් තිබීමයි.
2. ශක්තිමත් රාජ්‍යයක් තිබීමයි.
3. මනා සන්නිවේදනයක් පැවතීමයි.
4. නීතිය හා සාමය ක්‍රියාත්මක කිරීමයි.
5. ස්වයංවාරණයක් ඇති කර ගැනීමයි.

09. පුවත්පතක් කවර මතවාදී ස්වරූපයක සිටින්නේද යන්න ප්‍රකාශ වන්නේ,

1. ප්‍රවෘත්ති වලිනි
2. විශේෂාංග ලිපි වලිනි
3. පල කරන නිර්මාණ වලිනි
4. කතුවැකියෙනි
5. වෙළඳදැන්වීම් සහ වෙනත් දැන්වීම්වලිනි.

10. සිද්ධි කළමනාකරණ නිර්වචන අතර, පිලිප් කොට්ලර් 'සිද්ධි' යනුවෙන් (Event) නිර්වචනය කරන්නේ,

1. ආයතනයක සංවර්ධනය හා ප්‍රතිරූප ප්‍රවර්ධනය සිදු කරන ක්‍රියාවලියක් ලෙසය.
2. අර්බුදකාරී තත්ත්වයන් සමනය කිරීමට යොදා ගන්නා ක්‍රියා පිළිවෙලක් ලෙසය.
3. ඉලක්ක ගත ග්‍රාහක පිරිසක් වෙත විශේෂිත සන්දේශ ගෙන යාමට සැලසුම් කරන අවස්ථාවක් ලෙසය.
4. පුද්ගලයා ආයතනික සම්බන්ධතා මඟින් අදාළ පාර්ශව සමඟ මහජන සම්බන්ධතා පැවැත්වීමේ ක්‍රමවේදයක් ලෙසය.
5. ආයතනයක් මුහුණ දෙන අර්බුදවල දී ආයතනයක ප්‍රතිරූපය ආරක්ෂා කර ගැනීමට යොදා ගන්නා ක්‍රම ලෙසය.

11. පහත දැක්වෙන්නේ සන්නිවේදනය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ ප්‍රකාශ කිහිපයකි.

A - සන්නිවේදනයේ ආරම්භයත් සමඟ තොරතුරු ගබඩා කර කල්තබා ගැනීමට හැකි විය.
B - ජනමාධ්‍ය ආගමනය නිසා තොරතුරු විශාල පිරිසක් අතර බෙදා හැරීමට හැකි විය.
C - සිංහලයේ ''සන්නිවේදනය'' යන වචනයේ අර්ථය වන්නේ 'දැනගත් දේ දැන ගැනීමට සැලැස්වීම' යන්නයි
D - සන්නිවේදනය යම් ආකාරයකින් බිඳ වැටුණු විට ඒ හා බැඳුණු සමස්ත සන්නිවේදන පද්ධතියම ව්‍යාකුල වේ.

ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,

1. A හා B ය.
2. B හා C ය.
3. C හා D ය.
4. A හා C ය.
5. B හා D ය.

12. 'අදහස් දැනුම යනාදිය භාෂණය, ලේඛනය හෝ සංඥා මඟින් ප්‍රදානය කිරීම හෝ හුවමාරුකර ගැනීම සන්නිවේදනයයි'' යන අර්ථ කථනය ඉදිරිපත් කළේ,

1. ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂ විසිනුයි.
2. චාර්ල්ස් කුලී විසිනුයි.
3. වොරන් විවර් විසිනුයි.
4. විල්බර්ශ්‍රාම් විසිනුයි.
5. හැරල්ඩ් ඩී. ලැස්වෙල් විසිනුයි.

13. ගසක අලවා තිබූ දැන්වීමක් කියවීමට අපහසුවූයේ, හිරු රශ්මියට හසුවී අකුරු අවපැහැගැන්වී තිබූ නිසාය. මෙහි ඇතිවී ඇති සන්නිවේදන බාධකය වන්නේ,
   1. මාධ්‍ය බාධක
   2. අර්ථ බාධක
   3. සාක්ෂරතා බාධක
   4. ශාරීරික බාධක
   5. දෘශ්‍ය බාධක

14. සන්නිවේදන ක්‍රියාවලියක සාර්ථකත්වය කෙරෙහි බලපාන සන්නිවේදන මූලිකාංගය වන්නේ,
   1. සන්දේශයයි.
   2. ග්‍රාහකයා යි.
   3. සන්නිවේදකයා යි.
   4. අග්‍රස්ථානය යි.
   5. ප්‍රතිපෝෂණය යි.

15. 'තොරතුරු' සහ 'දැනුම' සම්බන්ධයෙන් ඉවත් කළ යුතු වරණය වන්නේ,
   1. තොරතුරු හා දැනුම යන්නෙහි අර්ථය සමානය.
   2. තොරතුරු විවිධ හේතු නිසා වෙනස් වන අතර දැනුම අර්ථවත්ව දිගටම පවතී.
   3. සන්දේශවල අඩංගුවන තොරතුරු දැනුම ලෙස මනසේ තැන්පත් වෙයි.
   4. තොරතුරුවලින් යමක් අර්ථකථනය කළ හැකිය.
   5. තොරතුරු අර්ථකථනය කිරීමෙන් දැනුම ජනිත වේ.

16. යුනෙස්කෝ නියෝජන ලැයිස්තුවට ශ්‍රී ලංකාවෙන් මුල් වරට සංරක්ෂිත අස්පර්ශනීය උරුමයක් ලෙස ඇතුළත් වූයේ,
   1. බලි ශාන්තිකර්ම නිර්මාණයි
   2. අම්බලන්ගොඩ නූල් රූකඩ කලාවයි.
   3. සාම්ප්‍රදායික අත්කම් නිර්මාණයි.
   4. ජන වෙදකමේ හාස්කමයි.
   5. සම්ප්‍රදායික තාල භාණ්ඩ ආශ්‍රිත නිර්මාණයි.

17. මාධ්‍ය ක්‍රියාකාරීත්වය තුළ 'මායාවක්' (මිත්‍යාවක්) සහ 'යථාර්ථයක්' පවතියි. එම මායාවෙන් බැහැර වූ යථාර්ථයන් තෝරන්න.
   A - අපි සන්නිවේදනයේ යෙදෙන්නේ අපට අවශ්‍ය වූ විට පමණි.
   B - අපි සන්නිවේදනය කරන්නේ වචනවල ඇති අර්ථය යි.
   C - වචනවල විශේෂිත අර්ථයක් නැති අතර අර්ථය හට ගත්තේ ග්‍රාහකයා තුළය.
   D - අපි නිරන්තරයෙන්ම සන්නිවේදනයේ යෙදෙන්නෙමු.
   E - අපට අන්‍යයන්ට නිවැරදි තොරතුරු ලබා දිය හැකිය.

   1. A, B හා D
   2. A, C හා D
   3. C හා D
   4. D හා E
   5. ඉහත කිසිවක් සත්‍ය නොවේ.

18. ජනශ්‍රැති පිළිබඳ හැඳින්වීමේ දී අවම සත්‍යතාවයක් ඇති වරණය වන්නේ,
   1. ජනශ්‍රැති පැවත එන්නේ කටපාඩමින් මුඛපරම්පරාගතවය.
   2. ජනශ්‍රැති නිර්මාණය කළ කර්තෘ සඳහන් නොවේ.
   3. ගැමි ජනතාවගේ බලපෑම මත ජනශ්‍රැති සමූහ පිළිගැනීමටකට ලක්වී තිබේ.
   4. ජනශ්‍රැති ගැමි ජන සමාජවල ප්‍රාථමික අවශ්‍යතා සපුරාලීමට නිර්මාණය වී ඇති ඥාන සම්භාරයකි.
   5. ජනශ්‍රැති තුළ ඉතිහාසය සහ ආගම බද්ධ වී විශ්වසනීයක්වයක් ගොඩ නඟා ඇත.

19. 'HUB' ආකෘතිය ඉදිරිපත් කිරීමට සහාය වූ විද්වතෙකි.
   1. ඩේවිඩ් කේ බර්ලෝ
   2. හැරල්ඩ් ඩී. ලැස්වෙල්
   3. ක්ලෝඩ් ෂැනොන්
   4. ශ්‍රාම් ඔස්ගුඩ්
   5. තෝමස් බෝර්න්

20. අනථ්‍ය සන්නිවේදනයේ ප්‍රධාන සංරචකය වන්නේ,
   1. නිෂ්කර්ෂණය යි.
   2. අපසරණය යි.
   3. අන්තර්ජාලය යි.
   4. සමාජ උපයෝගීතාවය යි.
   5. ප්‍රජානනයයි.

21. 'අන්තර් සංස්කෘති' අධ්‍යයනය මූලික වශයෙන් අවශ්‍යතාවයක් බවට පත් වූයේ,
   1. දෙවන ලෝක යුද්ධයෙන් පසු සංවර්ධන කටයුතුවල දී වෙනත් ජාතීන්, ජනවර්ග හා සංස්කෘතීන් සමඟ එක් එක් ජාතීන්ට කටයුතු කිරීමට සිදුවීම.
   2. මුළු විශ්වයම එකම ගම්මානයක් බවට පත්වීම
   3. විවිධ සංස්කෘතීන් අන්තර්ගත ටෙලිනාට්‍ය, චිත්‍රපටි, රූපවාහිනී මාධ්‍යයෙන් විකාශනය කිරීම.
   4. පුද්ගලයා අවට ලෝකයට අනුවර්තනය කර ගැනීමේ අවශ්‍යතාවයක් ඇති වීම.
   5. වෙනත් සංස්කෘතීන් දැන හඳුනා ගැනීමේ අවශ්‍යතාවයක් ඇති වීම.

22. ගුවන් විදුලියේ ප්‍රධානතම නිර්මාණ අභියෝගය වන්නේ කුමක්ද?
   1. ග්‍රාහක ස්ථානයේ සිටින ග්‍රාහකයින් හඳුනා ගැනීම.
   2. ග්‍රාහක මනසට හසුවන ලෙස ගුවන් විදුලි භාෂා භාවිතයෙන් රූප මැවීම.
   3. 'වැඩසටහන්වල අවශ්‍යතාවයට අනුව ශිල්පීන්ට නිර්මාණාත්මකව වචන උච්චාරණය පහුණු කිරීම.
   4. විවිද ක්ෂේත්‍ර අනුව ගුවන් විදුලි වැඩ සටහන් වර්ග කිරීම.
   5. අවස්ථා සහ චරිත නිරූපණයේ දී ශබ්ද සහ නිහඬ බව යොදා ගන්නා ආකාරය විමසීම.

23. සන්නිවේදන ක්‍රියාවලියක සන්නිවේදකයා යනු,
   1. තනි පුද්ගලයෙකි.
   2. කණ්ඩායමකි.
   3. සංවිධානයකි.
   4. ආයතනයකි.
   5. ඉහත සඳහන් ඕනෑම අවස්ථාවක් විය හැක.

24. 'ඥාන ව්‍යුහය' යනුවෙන් අදහස් කරන්නේ,
   1. මාධ්‍ය මගින් ගලා එන තොරතුරු විශ්ලේෂණය කිරීමයි.
   2. මාධ්‍යයෙන් ප්‍රචාරය වන තොරතුරු සම්බන්ධ පසුබිම පැහැදිලි කිරීමයි.
   3. මාධ්‍යයෙන් තමා නරඹන, අසන, කියවන වැඩසටහන් පිළිබඳව පමණක් මාධ්‍ය සාක්ෂරතාව ලබා ගැනීමයි.
   4. පුද්ගලයෙකුගේ මනසේ තැන්පත්වී ඇති සකස් වූ තොරතුරු කට්ටලය යි.
   5. මාධ්‍යයෙන් විකාශනය වන තොරතුරු විශ්ලේෂණය කිරීමයි.

25. උසස් කලාත්මක නිර්මාණ බිහිවූ සංස්කෘතිය වන්නේ,
   1. ගෝලීය සංස්කෘතිය යි
   2. ජන සංස්කෘතිය යි.
   3. සම්භව්‍ය සංස්කෘතිය යි.
   4. ජනප්‍රිය සංස්කෘතිය යි.
   5. සාම්ප්‍රදායික සංස්කෘතිය යි.

26. 'ජෝශප් ආර් ඩොමිනික්' විසින් මහජන සම්බන්ධතාවය සහ දැන්වීම්කරණය අතර පවතින සමානකමක් ලෙස දක්වන්නේ,
   1. දැන්වීම්කරණයත්, මහජන සම්බන්ධතාවයත් සන්නිවේදනයේ දී පුද්ගලාන්තර සබඳතා භාවිතා කරන බව.
   2. දැන්වීම්කරණය සහ මහජන සම්බන්ධතාව සන්නිවේදනය සඳහා භාවිතා කරන්නේ යන්ත්‍ර සහායක, සන්නිවේදන ක්‍රමෝපායන් බව.
   3. මෙම මාධ්‍ය දෙකෙහිම අරමුණ 'පෙළඹවීම' බව.
   4. මෙම මාධ්‍ය දෙක සඳහාම ඍජුවම මුදල් වැය වීමක් සිදුවන බව.
   5. දැන්වීම්කරණයත්, මහජන සම්බන්ධතාවයත් ප්‍රවර්ධනය සඳහා භාවිතයට ගන්නේ අනුග්‍රාහකත්ව මෙවලම් බව.

27. 'නිර්මාණාත්මක සන්නිවේදනයේ දී' රංග කලාවේ මූලිකාංගයක් වන ප්‍රාසාංගික මූලිකාංගයට අදාළ වන සංරචක වන්නේ,
   1. ජවනිකා, ඇඳුම්, කතා වස්තු, ආකෘතිය
   2. රංග භාණ්ඩ, ආලෝකය, ශබ්ද, වේශ නිරූපණය
   3. භාෂාව, ශෛලිය, වාග් ව්‍යවහාරය, ශබ්ද
   4. චරිත විශ්ලේෂණය, වාචික ප්‍රකාශන, ආවර්ජනය, වාග් ව්‍යාවහාර
   5. කායික භාෂාව, ප්‍රස්තුතය, විවරණය, නිෂ්පාදනය

28. මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය සඳහා අවශ්‍ය වන මානයක් වන 'සදාචාරාත්මක මානයෙන්' ඉවත් කළ යුතු උදාහරණය තෝරන්න.
   1. අඩ සියවසකටත් අධික කාලයක සිට ශ්‍රී ලාංකිකයෝ වස විෂ සහිත ආහාර අනුභව කරමින් සිටීම.
   2. අතිරේක පන්ති සංස්කෘතියේ ව්‍යාප්තිය පාසල් අධ්‍යාපනය හෑල්ලුවට ලක් කිරීම.
   3. රූපවාහිනී මාධ්‍යයේ යථාකාරී වැඩසටහන් ශ්‍රී ලාංකික සංස්කෘතියට බලපෑම් එල්ල කිරීම.
   4. අද ලෝකය පුරාම අන්තවාදී ද්වේශය මුල්කරගත් ආගම්වාදීන් විසින් ජනතාව බියට පත් කිරීම.
   5. මහනුවර දළදා පෙරහැර දහසකුත් එකක් කලා කෞශල්‍යයන්ගේ තෝතැන්නක් බඳු වීම.

29. පහත සඳහන් ඇරිස්ටෝටල් පඬිවරයාගේ සන්නිවේදන ආකෘතියේ A, B, C, D හි නිවැරදි අනුපිළිවෙල වන්නේ,




   1. කථාව, ග්‍රාහකයෝ, කථිකයා, බලපෑම
   2. කථිකයා, කථාව, ග්‍රාහකයෝ, බලපෑම
   3. කථාව, කථිකයා, ග්‍රාහකයෝ, බලපෑම
   4. බලපෑම, කථිකයා, ග්‍රාහකයෝ, කථාව
   5. කථිකයා, බලපෑම, කථාව, ග්‍රාහකයෝ

30. ස්ව සංකල්පය ගොඩ නැගීමට යෙදෙන සන්නිවේදන වර්ගය වන්නේ,
   1. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය යි.
   2. අන්තර්පුද්ගල සන්නිවේදනය යි.
   3. සමූහ සන්නිදෙව්නය යි.
   4. ජන සන්නිවේදනය යි.
   5. අතථ්‍ය සන්නිවේදනයයි.

31. මහජන සන්නිවේදනයට අදාළ නොවන වරණය වන්නේ,
   1. සන්නිවේදනය සිදුවන්නේ ජන සමූහයක් අරමුණු කරගෙනය.
   2. මෙහිදී ලබන ප්‍රතිපෝෂණය සීමා සහිතය.
   3. මෙය ක්‍රියාත්මක වන්නේ නිවාස, කාර්යාල වැනි පෞද්ගලිකව කිහිපදෙනෙකු රැස්වන ස්ථානයක සිටය.
   4. මහජන සන්නිවේදනයේ දී ග්‍රාහක පිරිස විවිධ ජන කොටස්වලින් සමන්විත විය හැකිය.
   5. මේ සඳහා තාක්ෂණික මෙවලම් භාවිතා කරනු ලැබේ.

32. 'HUB' ආකෘතියේ 'කේත' (Codes) යන්නෙන් දැක්වෙන්නේ,
   1. මාධ්‍ය සන්දේශ වාරණයට ලක්කරන ක්‍රියාවලිය යි.
   2 සන්නිවේදනය සඳහා යොදා ගන්නා බහුවිධ සංඥා පද්ධතිය යි.
   3. මාධ්‍ය විකෘතියක් ඇති කරන විවිධාකාර ඝෝෂා තත්ත්වය යි.
   4. ග්‍රාහකයන් සතු අත්දැකීම් පසුතලයයි.
   5. ජන සන්නිවේදන සන්දේශයන් ග්‍රහණය කරගන්නා පිරිසයි.

33. 'රූපණය' බිහි වන්නේ
   1. භාෂාව හඬ නගා භාවිතා කිරීමෙනි.
   2 ජන මාධ්‍ය සන්දේශ විසුරුවා හැරීමේ රටාව අනුවය.
   3. භාෂාව උච්චාරණය සමඟ ඉරියව් හා හැසිරීම් රටා දැක්වීමෙනි.
   4. නිර්වාචික සන්නිවේදනයේ යෙදීමේ දී භාවිතා කරන මෙවලම්වලිනි.
   5. විවිධ සන්නිවේදන අවස්ථා ග්‍රාහක ස්වරූපය අනුව වෙනස් කිරීමෙනි.

34. සමූහ සන්නිවේදනය සාර්ථක කර ගැනීමට ඉවහල් කර ගත හැකි විධි ක්‍රමයකි 'ආචාරශීලීභාවය' ඇති කර ගැනීම. ආචාරශීලීත්වය බිඳ වැටෙන අවස්ථාවකි,
   1. කණ්ඩායම තුළ ප්‍රසන්න වාතාවරණයක් ජනිත කිරීම.
   2. සාකච්ඡාවක දී තම වාරය එනතුරු නොඉඳ කරුණු ඉදිරිපත් කිරීම.
   3. කණ්ඩායම තුළ සංවර බව වර්ධනය කිරීම.
   4. කථනය, අවාචික ඉරියව් යනාදියෙන් අචිරශීලීත්වය ප්‍රදර්ශනය කිරීම.
   5. සමූහයට අලුතින් එකතු වන අය සමූහයේ ආචාරශීලී හැසිරීම් තේරුම් ගැනීමට උත්සාහ කිරීම.

35. 'ඩබ්. ජේම්ස් පෝටර්' දක්වන ආකාරයට මාධ්‍ය සාක්ෂරතාව දියුණු කර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජනකි.
    1. පුද්ගලයෙකුට තම මානසික චර්යාව පාලනය කර ගැනීමට හැකි වීම.
    2. මාධ්‍ය නාලිකා මඟින් තම නාලිකාව පිළිබඳව කරනු ලබන ඇගයීම්වලට අවනත වී බාහිර වාසි ලබා ගැනීමට හැකි වීම.
    3. විවිධ වූ මාධ්‍ය සන්දේශ රස විඳීමේ හැකියාව ලැබීම.
    4. අන්තර්ජාලය තුළ ඇති සීමා රහිත වූ විනෝදාස්වාදය සහ තොරතුරු ග්‍රහණය කර ගැනීමට හැකි වීම.
    5. මාධ්‍යයෙන් ප්‍රචාරය වන වෙළඳ, දැන්වීම් සහ අනුග්‍රාහකත්වය තුළින් ජීවිතය නව ආරකට ගෙන යාමට හැකි වීම.

36. 'මනෝවිශ්ලේෂණවාදී' විචාරයට අනුව මාධ්‍ය වෙළෙඳ දැන්වීම්වල ක්‍රියාවලියක් වන්නේ,
    1. ඉතා බලවත් සංස්කෘතික ආරක්ෂණ මෙවලමක් ලෙස කටයුතු කරයි.
    2. මාධ්‍යයෙන් මතු කරන ආතතියට විසඳුමක් ලෙස නව භාණ්ඩ හඳුන්වා දෙයි.
    3. මිනිසාගේ සිහි කල්පනාවේ සැඟවී ඇති සිතිවිලිවලට ආමන්ත්‍රණය කිරීමේ මාර්ගයක් ලෙස කටයුතු කරයි.
    4. පූර්ණ වූ සමාජ සේවකයෙකු සතුවිය යුතු ලක්ෂණ මතුකර දක්වයි.
    5. දේශියත්වයෙන් ඔබ්බට ගිය පෞරුෂත්වයක් ගොඩ නැංවීමේ උත්සාහයක යෙදෙයි.

37. පහත සඳහන් ප්‍රකාශවලින් භාෂාව යන්නෙහි අර්ථය ඉක්මවා යන වැකිය වන්නේ,
    1. රූපවාහිනී මාධ්‍යයේ භාෂාව, රූප මාධ්‍ය භාෂාවේ සහ ශබ්ද මාධ්‍ය භාෂාවේ දිගුවකි.
    2. මුද්‍රිත මාධ්‍යවල දී ප්‍රමුඛ වන්නේ ලිඛිත භාෂාව වන අතර රූප යනාදිය ද භාවිතා වේ.
    3. රූපවාහිනී මාධ්‍ය භාෂාව සිනමා භාෂා දිගුවක් නොව ගුවන්විදුලි මාධ්‍යයේ සංවර්ධනයක් ලෙස බිහිවී තිබේ
    4. රූපවාහිනි මාධ්‍ය විවිධ වැඩසටහන් නිර්මාණය කරන්නේ නිර්මාණාත්මක භාෂා ප්‍රයෝග අභිබවා තාක්ෂණය පදනම් කරගෙනය.
    5. ගුවන්විදුලියේ දී ශ්‍රවණය ඔස්සේ භාෂාව මගින් සංකල්ප හෝ අවස්ථා මවා ගැනීමට සිදුවේ.

38. 'මාධ්‍ය සංස්කෘතිය' යන්නට අර්ථවත් නොවන වාක්‍ය තෝරන්න.
    1. මාධ්‍ය පාදක කොටගෙන සිදුවන මානව ක්‍රියාවලිය යි.
    2. මුලු ලෝකය පුරාම පුද්ගලයාත් සමාජයත් අතර ක්‍රියාත්මක වන සන්නිවේදන මාධ්‍යයන්ගේ සක්‍රීය ක්‍රියාකාරීත්වය යි.
    3. ද්‍රව්‍යමය සහ ආධ්‍යාත්මික වටිනාකම්වල එකතුව මාධ්‍ය හරහා මිනිසා වෙත නැවත සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රියාවලිය යි.
    4. පවතින සාම්ප්‍රදායික සංස්කෘතිය මාධ්‍යයෙන් දෙන සංස්කෘතියට පරිවර්තනය වීමයි.
    5. මාධ්‍යයේ බලපෑම බලවත්ව ඇති සමාජයක සංස්කෘතිය යි.

39. සක්‍රිය ග්‍රාහකයෙකුගේ ලක්ෂණයකි.
    1. තොරතුරු ලැබෙන්නේ කෙසේදැයි ප්‍රශ්න කර තොරතුරු පමණක් ග්‍රහණය කර ගැනීම.
    2. තොරතුරු කොහෙන් ලැබේදැයි ප්‍රශ්න නොකර තනිවම ඒවා අවබෝධ කර ගැනීම.
    3. ආකුල - ව්‍යාකුල සමාජ පරිසරය තුළ මාධ්‍ය සන්දේශ විචාරීම අනවශ්‍ය ගැටලුවක් ලෙස සැලකීම.
    4. සක්‍රිය මාධ්‍ය ග්‍රාහකත්වය නිසගයෙන් ලැබෙන බුද්ධියක් ලෙස සැලකීම.
    5. විමර්ශනාත්මකව මාධ්‍ය සන්දේශ වටහා ගැනීම සඳහා අවශ්‍ය දැනුම නිරන්තයෙන් සෙවීම.

40. මාධ්‍ය මහජන සම්බන්ධතාවයේ ප්‍රධාන අරමුණ වන්නේ,
    1. මාධ්‍ය නියෝජනය කරන ආයතන සහ ශිල්පීන් සමඟ යහපත් සම්බන්ධතාවයක් පැවැත්වීම.
    2. නව භාණ්ඩ සහ සේවාවන් හඳුන්වා දෙමින් ප්‍රවර්ධන උපක්‍රම ව්‍යාප්ත කිරීම.
    3. තමා නියෝජනය කරන ආයතනය වෙනත් ආයතන මඟින් තරගකාරීව අභිබවා යන විට මාධ්‍ය මඟින් පාලනය කරවීම.
    4. ආයතනයේ අභ්‍යන්තර සහ බාහිර පාර්ශව සමඟ ආයතනයේ දියුණුවට ක්‍රියාමාර්ග ගැනීම.
    5. ආයතනයේ කීර්ති නාමය සහ ප්‍රතිරූපය ඉහළ නැංවීමට ජනමාධ්‍ය වල සහාය ලබා ගැනීම.

41. 'රාත්‍රී නිදිමරාගෙන පාඩම් කරනවාට වඩා හිමිදිරියේ පිබිදී පඩම් කිරීමට තමා කැමති බව' රුචිරා අමන්දාට කීවාය. රුචිරා කියූ දෙයට අමන්දා ප්‍රතිචාරයක් නොදැක්වී නම් එම ප්‍රකාශයෙන්,
   1. දෙදෙනාම එකම සිතිවිල්ල දරන්නන් බවට පත්වෙයි.
   2. එම ප්‍රකාශය බොහෝ දෙනෙකු අනුමත කරන පොදු අදහසක් බවට පත්වෙයි.
   3. රුචිරාගේ ප්‍රකාශය අමන්දා තුළ වර්ධනය වීමක් සිදුවෙයි.
   4. රුචිරාගේ ප්‍රකාශය නිශේධ වීමක් සිදුවෙයි.
   5. දෙදෙනාම එම ප්‍රකාශය අත්හල අය බවට පත්වෙයි.

42. තේමාත්මක අන්තර්ගතය, අවම පිරිවැය, නම්‍යශීලීත්වය යන සුවිශේෂතා දක්නට ලැබෙන්නේ,
   1. ජනමාධ්‍ය තුළය. 2. සාම්ප්‍රදායික මාධ්‍ය තුළය.
   3. නව මාධ්‍ය තුළය. 4. නූතන මාධ්‍ය තුළය.
   5. සමාජ මාධ්‍ය තුළය.

43. නව තාක්ෂණය උපයෝගී කරගනිමින් දත්ත හුවමාරු කර ගැනීම.
   1. ජාලගත කරණයයි. 2. අධිපාඨනීයත්වයයි. 3. අන්තර් ක්‍රියාකාරීත්වයයි.
   4. ස්වයංකරණයයි. 5. අංකිතකරණයයි.

44. දිවයිනේ උසස් පාසලක් ලෙස කිසියම් පාඨශාලාවක පැවැත්ම තහවුරු කිරීමට භාවිතයට ගත හැකි මහජන සම්බන්ධතා මෙවලම් කිහිපයක් සහිත කට්ටලය වන්නේ,
   1. ලිපි යැවීම, රැස්වීම් පැවැත්වීම, වැඩසටහන් දියත් කිරීම.
   2. අභ්‍යන්තර ඇමතුම් පද්ධති, පෝස්ටර්, දැන්වීම්
   3. අත්පත්‍රිකා, ඡායාරූප, සම්මන්ත්‍රණ
   4. වාර්ෂික වාර්තාව, ආචාරධර්ම ප්‍රකාශන, වෙබ් අඩවි
   5. යෝජනා පෙට්ටි, පුවත් හසුන්, විද්‍යුත් තැපැල

45. නිර්මාණශීලී රචනයක අරමුණ විය යුත්තේ,
   1. විශාල ග්‍රාහක පිරිසකට එකවර විනෝදාස්වාදය සැපයීම.
   2. රසිකයා තුළ රසභාවයන්ගෙන් පරිපූර්ණ වූ චිත්ත ස්වභාවයක් ඇති කිරීම.
   3. රසිකයා තුළ ත්‍රාසය, නොඉවසිල්ල, කුතුහලය, ආවේගාත්මකභාවය නිර්මාණය කිරීම.
   4. ග්‍රාහක අවධානය මඳකුත් බිඳීමට ඉඩ නොතබා නැවුම් ශෛලියකින් අත්දැකීම් විඳගැනීමට සැලසීම.
   5. ව්‍යංගාර්ථවලින් පරිපූර්ණ වූ, කුතුහලයෙන් පිරි අවසානයේ ගැටුම පරිසමාප්ත වන නිර්මාණයක් කිරීම.

46. පුද්ගලයෙකු ඡායාරූප ගතකිරීමේ දී ඔහුගේ හිටගෙන ඉන්නා ස්වරූපය දක්වමින් මුළු ශරීරයම ඡායාරූපයට හසු කර ගත හැක්කේ,
   1. සමීප රූපයේදීය. 2. මධ්‍යම රූපයේදී ය. 3. ඉතා සමීප රූපයේදී ය.
   4. දුර රූපයේ දීය. 5. මධ්‍යම දුර රූපයේදී ය.

47. අතීතයේ දී මහජන සම්බන්ධතා නිලධාරී වෘත්තිය විවිධ රටවල විවිධ නම්වලින් හඳුන්වා තිබේ. මිසරය, ඊශ්‍රායලය, එංගලන්තය. එය හඳුන්වා ඇති ආකාරය දැක්වෙන පිළිතුර තෝරන්න.
   1. සෝෂක, ලියන්නා, ශාස්තෘවරයා, ප්‍රධාන උපදේශක
   2. දිවැසිවරයා, සෝෂක, ප්‍රචාරකයා, ලියන්නා
   3. ලියන්නා, ප්‍රධාන උපදේශක, ශාස්තෘවරයා, ප්‍රචාරක
   4. ප්‍රචාරක, ප්‍රධාන උපදේශක, සෝෂක, ලියන්නා
   5. ප්‍රචාරක උපදේශක, දිවැසිවරයා, ලියන්නා, ප්‍රචාරක

48. විවිධ වූ ක්‍රියාවලීන් තුළ 'සිද්ධි කළමනාකරු' අවස්ථා පැවැත්වීමට වර්තමාන ජනතාව නැඹුරුවක් දක්වයි. එවැනි එක් අවස්ථාවක් වන විශ්‍රාමික පුද්ගලයන් සඳහා සිද්ධි කළමනාකරණ අවස්ථා සඳහා දැක්වෙන උදාහරණ වන්නේ,
   1. විනෝද චාරිකා, ආගමික වැඩසටහන්, සංගීත වැඩසටහන්
   2. වෙළෙඳ ප්‍රදර්ශන, සංස්කෘතික ප්‍රදර්ශන, චාරිකා
   3. කලා උත්සව, පාගමන්, නාට්‍ය දර්ශන
   4. ජන ක්‍රීඩා, ක්‍රීඩා සමාජ අතර තරඟ, විනෝද චාරිකා
   5. විනෝද ගමන්, ප්‍රදර්ශන, විදේශ සංචාර

49. එක්තරා රාජ්‍ය ආයතනයක සිදු වෙමින් පවතින වංචනික දූෂිත ක්‍රියාවක් පිළිබඳ රූපවාහිනී නාලිකාවකින් ප්‍රචාරය විය. එම ජනමාධ්‍ය ඉටු කළ කාර්ය අයත්වන ක්‍රියාවලිය වන්නේ,

1. තොරතුරු සම්පාදනය යි.
2. අර්ථකථනයයි
3. පෙළඹවීමයි.
4. සුපරීක්ෂණය යි
5. සහ සම්බන්ධතාවය යි.

50. ඡායාරූපකරණයේ දී, 'සංස්ථාපන රූපයකින්' (Establishing shot) සිදුකළ හැකි අවස්ථා වන්නේ,

A - දුර රූපයක් නිර්මාණය කිරීම.
B - ඈත ප්‍රදේශයක හාත්පස ප්‍රදේශය පෙන්වීම.
C - පසුබිම පිළිබඳ අදහසක් දීමට හැකි වීම.
D - අදාල වස්තුවේ හෝ චරිතයේ සියුම් ලක්ෂණ හැඟීම් යනාදිය දැකගත හැකි වීම.
E - කිසියම් සිදුවීමක් සිදු වූ ස්ථානය පිළිබඳ තොරතුරු ඉතා පැහැදිලිව දැකගත හැකි වීම.

ඉහත ප්‍රකාශ අතුරින්,

1. A, B හා D නිවැරදිය
2. A,B,C, D, E නිවැරදිය.
3. A,B,E නිවැරදිය
4. A,B,C නිවැරදිය
5. A, E නිවැරදිය

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

29 S II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

First Term Test - Grade 13 - 2019

විභාග අංකය ..........................   සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II   කාලය පැය තුනයි

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. (i) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ඉටුවන සන්නිවේදන අරමුණු හතරක් නම් කරන්න. (ල. 2)
(ii) රූපවාහිනී මාධ්‍ය නැරඹීම තුළින් ළමයින් තුළ සිදුවන ප්‍රධාන වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න.(ල.4)
(iii) සන්නිවේදන විෂය ශාස්ත්‍රීය විෂයයක් ලෙස අධ්‍යයනය කිරීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ල. 6)
(iv) නව මාධ්‍යයන්හි දක්නට ලැබෙන ලක්ෂණ හතරක් දක්වා විස්තර කරන්න. (ල. 8)

02. (i) ගුවන්විදුලි මාධ්‍යයේ නිර්මාණශීලීභාවයට අදාළ පොදු ගුණාංග හතරක් නම් කරන්න. (ල. 2)
(ii) ඒක මාර්ගික මහජන සම්බන්ධතාවය සඳහා යොදා ගන්නා මෙවලම් හතරක් සහ විධික්‍රම හතරක් නම් කරන්න. (ල. 4)
(iii) ස්ත්‍රීවාදී විචාරයෙන් පෙන්වා දෙන ආකාරයට මාධ්‍ය තුළ කාන්තාව නිරූපණය කරන ආකාරයන් හතරක් දක්වා දෙකක් පැහැදිලි කරන්න. (ල. 6)
(iv) සාම්ප්‍රදායික මාධ්‍යයේ වැදගත්කම කරුණු හතරක් ඇසුරින් විස්තර කරන්න. (ල. 8)

03. (i) මාධ්‍ය සාක්ෂරතාව ලබා ගැනීම සඳහා විවිධ මානනයන්ගෙන් ලැබෙන තොරතුරු ද අවශ්‍ය වේ. පහත සඳහන් ගොනු අයත් වන මානනයන් නම් කරන්න.
1. ආදරය, වෛරය, සබකෝළය
2. උපන්දිනයන්, ශාලාවකට මුල්ගල තැබූ දිනය, විවිධ නිර්වචනයන්
3. හොඳම ටෙලි නාට්‍ය අධ්‍යක්ෂ, හොඳම කැමරාකරණය, පසුතල සැකැස්ම
4. කිසියම් රූපවාහිනී නාලිකාවකින් මව සහ දරුවාගේ නැටුම අනුව හොඳම මව තේරීමේ යථාකාරී වැඩසටහන. (ල. 2)

(ii) ඔස්ගුඩ් - ශ්‍රාම් ආකෘතිය ඇඳ නම් කර, එම ආකෘතියත් ලැස්වෙල් ආකෘතියත් අතර දැකිය හැකි වෙනස්කම් තුනක් දක්වන්න. (ල. 4)
(iii) භාෂාව නිපදවා ගැනීම ඔස්සේ මිනිසා අත්පත්කර ගත් හැකියාවන් හතරක් දක්වා ඉන් දෙකක් විස්තර කරන්න. (ල. 6)
(iv) විමල්, නාමල් ඇතුළු සිසුන් බොහෝ දෙනෙකු උසස් පෙළ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යාපනය විෂයය හැදෑරීමට තීරණය කර තිබේ. එම විෂය හැදෑරීම තුළින් ලැබෙන ප්‍රතිලාභ හතරක් විස්තර කරන්න.(ල. 8)

04. (i) බ්‍රිතාන්‍යයේ මහජන සම්බන්ධතාව පිළිබඳ විශේෂඥවරයෙක් වන 'සෑම් බ්ලැක්' මහජන සම්බන්ධතාව නිර්වචනය කර ඇත්තේ කෙසේදැයි දක්වන්න. (ල. 2)

(ii) සන්නිවේදන මූලිකාංග හතරක් නම් කර, ඉන් දෙකක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඇසුරින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 4)

(iii) වාචික සන්නිවේදනයේ කාර්යයන් හතරක් නම් කරන්න. කිසියම් පණිවිඩයක් ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීමට සන්නිවේදකයෙකු සතුවිය යුතු වාචික සන්නිවේදන කුසලතා දෙකක් විස්තර කරන්න. (ල. 6)

(iv) ගම පුරා පැතිර ගිය කට කතාවක් නිසා ගැමියන් අතර නොසන්සුන් තාවයක් ඇති විය. මෙම තත්ත්වයට අදාළ සන්නිවේදන ස්වරූපය දක්වා එහි ලක්ෂණ හතරක් විස්තර කරන්න. (ල. 8)

05. (i) නිර්මාණ බිහි කිරීමේ දී නිර්මාණ කරුවෙකු තුළ තිබිය යුතු බහුවිධ සාධක හතරක් නම් කරන්න. (ල. 2)

(ii) 'රාජ්‍ය මහජන සම්බන්ධතාවය' යන්න හඳුන්වා රාජ්‍ය මහජන සම්බන්ධතාවයක දී අවධානය යොමු කරනු ලබන කරුණු දෙකක් දක්වන්න. (ල. 4)

(iii) රූපවාහිනී මාධ්‍ය සැලකෙන්නේ වශීකෘත (Glamorous) මාධ්‍යයක් ලෙසය. එවැනි මාධ්‍යයක රඳා පැවැත්මට හේතුවන ලක්ෂණ හතරක් දක්වා ඉන් දෙකක් විස්තර කරන්න. (ල. 6)

(iv) ප්‍රගීත් ලබන වසරේ උසස් පෙළ විභාගයට පෙනී සිටිය යුතු වුවත් ජංගම දුරකථන, සමාජ ජාල, රූපවාහිනිය, විදේශීය චිත්‍රපටි සහ නොගැළපෙන සම්බන්ධතා යනාදියට ආකර්ෂණය වී විභාග ඉලක්කය මඟ හැරගෙන සිටියි.

අ) මාධ්‍ය සාක්ෂරතාවයේ සිද්ධාන්ත වන 'ස්ව කේන්ද්‍රය' (Personal lons) යන්න හඳුන්වන්න.

ආ) ප්‍රගීත් සම්බන්ධ ස්ව කේන්ද්‍රය දුර්වල වී ඇත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න.

ඇ) 'ස්ව කේන්ද්‍රය' ක්‍රියාත්මක වන ක්‍රම දක්වා ප්‍රගීත් සම්බන්ධයෙන් එය ක්‍රියාත්මක වී ඇති ආකාරය කරුණු 2 ක් සම්බන්ධකරගෙන සාකච්ඡා කරන්න.

ඈ) ප්‍රගීත්ට තම ස්ව කේන්ද්‍රය නැවත ශක්තිමත් කර ගැනීමට හැකි වන්නේ කෙසේදැයි කරුණු දෙකක් ආශ්‍රයෙන් දක්වන්න. (ල. 8)

06. (i) ළමා පරපුර හා මාධය භාවිතය පිළිබඳව ගෲන්-වල්ට් ප්‍රකාශනය මඟින් ඉදිරිපත් කළ නිර්දේශ දෙකක් දක්වන්න. (ල. 2)

(ii) කිසියම් ව්‍යාපාරියෙකුට තම ව්‍යාපාරය වෙනුවෙන් පාරිභෝගිකයා ආකර්ෂණය කර ගැනීමට භාවිතා කළ හැකි මහජන සම්බන්ධතා ක්‍රම හතරක් දක්වන්න.
එම ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කළ හැකි මහජන සම්බන්ධතා උපක්‍රම හතරක් නම් කරන්න. (ල.4)

(iii) 'සන්නිවේදනය සන්දර්භානුගතය' උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) ජනමාධ්‍ය මගින් ඉටුකරන කාර්යයක් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මුර සෙබලෙකුගේ භූමිකාව ඉටු කිරීමයි. මෙහි අදහස පැහැදිලි කර වර්තමාන සමාජයෙන් උදාහරණ හතරක් ඉදිරිපත් කරන්න. (ල. 8)

07. (i) යුනෙස්කෝ 'මෙනි වොයිස් වන් වල්ඩ්' (Many voice one world) කෘතියේ සඳහන් කළ පරිදි ජනමාධ්‍යයට සුවිශේෂී වූ කාර්ය භාරයන් හතර නම් කරන්න. (ල. 2)

(ii) ඵලදායී සංදේශයක ප්‍රධාන ගුණාංගයක් වන 'සරල බව' සහතික කිරීමට ඇසිය යුතු ප්‍රශ්න කවරේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) සාම්ප්‍රදායික සංස්කෘතියෙන් පසුව බිහිවූ නව සංස්කෘතික ප්‍රවණතා දෙක නම් කර විස්තර කරන්න. (ල. 6)

(iv) වර්තමානයේ දක්නට ලැබෙන සංස්කෘතික ප්‍රභේදයක් ලෙස 'ජනප්‍රිය සංස්කෘතිය' හැඳින්විය හැකිය. ජනප්‍රිය සංස්කෘතිය තුළ දැකිය හැකි ලක්ෂණ හතරක් විස්තර කරන්න. (ල. 8)

## පළමු වාර පරීක්ෂණය - 2019 - 13 ශ්‍රේණිය - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

# I කොටස

### පිළිතුරු පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01. - 5 | 11. - 5 | 21. - 1 | 31. - 3 | 41. - 4 |
| 02. - 3 | 12. - 1 | 22. - 2 | 32. - 2 | 42. - 2 |
| 03. - 2 | 13. - 1 | 23. - 5 | 33. - 3 | 43. - 4 |
| 04. - 3 | 14. - 5 | 24. - 4 | 34. - 2 | 44. - 4 |
| 05. - 4 | 15. - 1 | 25. - 3 | 35. - 1 | 45. - 2 |
| 06. - 3 | 16. - 2 | 26. - 3 | 36. - 3 | 46. - 4 |
| 07. - 4 | 17. - 3 | 27. - 4 | 37. - 4 | 47. - 1 |
| 08. - 3 | 18. - 3 | 28. - 5 | 38. - 3 | 48. - 1 |
| 09. - 4 | 19. - 5 | 29. - 2 | 39. - 5 | 49. - 4 |
| 10. - 3 | 20. - 3 | 30. - 1 | 40. - 1 | 50. - 4 |

# II කොටස

### පිළිතුරු

01. (i) තොරතුරු සම්පාදනය, උපදෙස් සම්පාදනය / අධ්‍යාපන ලබා දීම, පෙළඹවීම, විනෝදාස්වාදය

(ල. 2)

(ii) වේදනාත්මක දේ පිළිබඳ සංවේදීතාවය අඩු වීම, දරුවන් ජීවත් වන අවට පරිසරය පිළිබඳ බියක් ඇති කර ගැනීම, අන් අය සමඟ කටයුතු කිරීමේ දී ඉකමණින් ආක්‍රමශීලී වීම හා ආරවුල් ඇති කර ගැනීමට නැඹුරු වීම රූපවාහිනී ප්‍රවෘත්ති, කාටූන්, චිත්‍රපට, නාට්‍ය ආදී වැඩසටහන් තුළින් ඉදිරිපත් කරන පුද්ගල ඝාතන, සොරකම් කිරීම්, අදෘශ්‍යමාන බලපවේග සහිත දෑ නැරඹීම ඉහත කරුණු සඳහා බලපාන ආකාරය විග්‍රහ කළ යුතුය.

(ල. 4)

(iii) ලෝක යුධ සමයෙන් පසු තොරතුරු වාර්තා කිරීම සඳහා යොදා ගත් මාධ්‍ය ජනතාව වෙනුවෙන් විනෝදාස්වාදය හා තොරතුරු සම්පාදනය සඳහා යොදා ගැනීම.
යුද්ධයෙන් බිඳ වැටුණු ජනතාවගේ මානසිකත්වය ගොඩනැංවීම සඳහා සරල විනෝදය ගෙන දෙන වැඩසටහන් ඉදිරිපත් කිරීම.
වානිජ පරමාර්ථ සඳහා මාධ්‍ය යොදා ගැනීම
මාධ්‍ය හිමිකරුවන් හා දේශපාලන නායකයන් විසින් අත්තනෝමතික ලෙස පාලනය කිරීමට පෙළඹීම.

(කරුණු 4 ට ලකුණු ල. 2 / විස්තර කිරීමට ල. 4)

(iv) අංකිතකරණය, ජාලගතකරණය, අන්තර් ක්‍රියාකාරීත්වය, අධි පාඨනීයත්වය, ස්වයංකරණය, දත්ත සංචිතය, වේගවත් සංදේශකරණය

(කරුණු 4 ක් විස්තර කිරීම සඳහා ල. 8)

02. (i) 1. සරල බව 2. එක් වරකින් තේරුම් ගත යුතු බව 3. ශ්‍රවණ කේන්ද්‍රීය එළඹුම
4. දිගු සංකීර්ණ වාක්‍ය යොදා නොගැනීම 5. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයට අවකාශ සැලසීම
6. ඉලක්ක ග්‍රාහක අත්දැකීම් පසුතලයට ආමන්ත්‍රණය කිරීම

(කරුණු 4ට ල. 2)

(ii) මෙවලම්
1. ප්‍රවෘත්ති නිවේදන 2. මාධ්‍ය කට්ටල 3. පොත් පිංච 4. විස්තර පත්‍රිකා 5. පුවත් හසුන
6. වාර්ෂික වාර්තා 7. ඡායාරූප (ල. 2)
විධි ක්‍රම
1. තෑගි ලබා දීම 2. සම්මාන පිරිනැමීම 3. දිරි දීමනා 4. උපදේශනය 5. අරමුදල් ලබාදීම
6. මහජනමතය විමසීම 7. විශේෂ සිද්ධි කළමනාකරණය (ල. 2)

(iii) ඒකාකෘතික ලෙස කාන්තාව නිරූපණය කිරීම.
ස්වභාවිකව හැසිරෙන ස්ත්‍රීන් මාධ්‍යයෙන් දක්නට ලැබීම.
මවුවරු, භාර්යාවන්, දියණියන්, පෙම්වතියන්, ලිංගික භාණ්ඩ ලෙස නිරූපණය කිරීම.
ස්ත්‍රීන්ගේ වටිනාකම් මාධ්‍ය මගින් නොසලකා හැරීම. (උදා: සිරස සුපර්මම් රියැලිටි වැඩසටහන, ඉතා හොඳින්ම නටන ගැහැණිය, හොඳම මව ලෙස නම් කිරීම.) (දෙකක් පැහැදිලි කිරීමට 2 x2 = 4 (4 + 2 = 6)

(iv) 1. දැනුම් ඉගෙනුම් සම්පාදනය
2. උපදේශාත්මක සංදේශ ජනනය කළ හැකි වීම
3. සංස්කෘතික අංග හුවමාරු කිරීමට හැකිවීම.
4. විනෝදාස්වාදය සඳහා යොදා ගත හැකි වීම.
5. අහිතකර සමාජ ප්‍රවණතා විවේචනයට ලක් කිරීම.
6. භාව ප්‍රකාශනය

(නම් කිරීමට - 02, විස්තර කිරීමට ල.6 )

03. (i) * චිත්තවේගී තොරතුරු * සංජානන තොරතුරු
* සෞන්දර්යාත්මක තොරතුරු * සදාචාරාත්මක තොරතුරු

(ii) රූපසටහන ඇඳීමට - ල.01
වෙනස්කම්
ලැස්වෙල් ආකෘතිය රේඛීය ආකෘතියක් වන අතර ඔස්ගුඩ් ආකෘතිය චක්‍රීය ආකෘතියකි.
ලැස්වෙල් ආකෘතියෙන් ප්‍රතිපෝෂණය සිදු නොවන අතර ඔස්ගුඩ් ආකෘතියේ ප්‍රතිපෝෂණය සිදුවේ.
ලැස්වෙල් ආකෘතියේ බලපෑම පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන අතර ඔස්ගුඩ් ආකෘතිය එසේ නොවේ.
ලැස්වෙල් ආකෘතිය සන්නිවේදක කේන්ද්‍රීය වන අතර ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතිය සන්නිවේදකයාසේ ම ග්‍රාහකයා ද වැදගත් වේ. (කරුණු 03 කට ල. 3)

(iii) සංවිධානය වීමේ හැකියාව, තර්කානුකූලව යමක් වටහා ගැනීමේ හැකියාව, භාෂා මාධ්‍යයෙන් යමක් සිතෙහි තැන්පත් කර ගැනීමේ හැකියාව, අවශ්‍ය විටෙක මතකය තුළින් සිහි කැඳවා ගැනීමේ හැකියාව, ලිඛිත භාෂාව ඔස්සේ දැනුම ගබඩා කිරීමේ හැකියාව, පූර්වයෙන් නිෂ්පාදිත දැනුම කියවා වටහා ගැනීමේ හැකියාව.
කරුනු 4 සඳහා ල.2, 2 ක් විස්තර කිරීමට ල.4 (ලකුණු 06)

(iv) * සන්නිවේදන කුසලතා වර්ධනය වීම * විචාරශීලීව මාධ්‍ය පරිහරණය කළ හැකි වීම.
* මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධ කර ගත හැකි වීම.
* මාධ්‍ය ආචාර ධර්ම හා නියාමනය පිළිබඳ අවබෝධය ලැබීම.
* මාධ්‍ය සාක්ෂරතාවය ඇති වීම. (ල. 8)

(එකතුව = 20)

04. (i) 'කිසියම් සංවිධානයක් සම්බන්ධතා පවත්වන අභ්‍යන්තර හා බාහිර සියලු දෙනාම අතර අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කිරීම සඳහා කරනු ලබන සෑම දෙයක්ම මහජන සම්බන්ධතා නම් වේ.'' (ල. 2)

(ii) සන්නිවේදකයා, ග්‍රාහකයා, සංදේශය, ප්‍රතිපෝෂණය, බාධක ආකේතකරණය, විකේතිකරණය, අත්දැකීම් පසුතලය, සන්දර්භය බලපෑම, නාලිකාව වැනි මූලිකාංගවලින් හතරක් නම් කර දෙකක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් නිදසුන් දක්වමින් විස්තර කළ යුතුය. (නම් කිරීමට ල. 2, විස්තර කිරීමට ල.2 )

(iii) ඉගැන්වීම, උපදෙස් දීම හා මඟ පෙන්වීම
පුද්ගලයන් අතර තොරතුරු හුවමාරුව
මානව සබඳතා ඇතිවන භාවයන් ප්‍රකාශයට පත් කිරීම.
පුද්ගල පෞරුෂය ඇති කිරීම හා විවිධ කාර්යයන් ඉටු කර ගැනීම.
කුසලතා
වාග් කෝෂය පුළුල් කර ගැනීම
තමා සතු අදහස් හා තොරතුරු ඇතුළත් දැනුම වර්ධනය කර ගැනීම. (පිටුව 39 - 12 ශ්‍රේණිය)

(iv) අවිධිමත් සන්නිවේදනය (ල. 2)
ලක්ෂණ
මූලාශ්‍රය පැහැදිලිව හඳුනාගත නොහැකි වීම., නිල ස්වභාවයක් නොමැති වීම, නිල ප්‍රකාශයක් හෝ විධිමත් සන්නිවේදනයක් නොමැති වීම, වේගයෙන් පැතිර යාම, ජනතාවගේ හැඟීම් ආකල්ප, විරෝධතා ආදිය ප්‍රකාශ කිරීමට ඉඩකඩ සළසා දීම.
නූතන සන්නිවේදන ක්‍රම භාවිතයෙන් සන්නිවේදනය වඩාත් ප්‍රබලව හා ආකර්ෂණීයව සිදු වීම.

(කරුණු $4 \times 1\frac{1}{2}$ = ල.6)

05. (i) * නිර්මාණකරුගේ කුසලතා , ප්‍රතිභාව, පරිකල්පනය ව්‍යුත්පන්තිය, සතතාභ්‍යාසය, බහුශ්‍රැතතාව, දාර්ශනික සංකල්පනා, අරමුණු (ල. 2)

(ii) අන්තර්ජාතිකව රාජ්‍ය දෙකක් හෝ කිහිපයක් සමඟ ඇතිකරගෙන පවත්වාගෙන යනු ලබන යහපත් සබඳතාවය යි.

* රාජ්‍යයක විදේශ ප්‍රතිපත්තිය
* විවිධ අන්තර්ජාතික සංවිධාන පිහිටුවා ගැනීම.
* තානාපති කාර්යාල සමඟ පවත්වන සම්බන්ධතා (ල. 2 + 2 = 4)

(iii) වශීකෘත මාධ්‍ය තුළ සම්භාව්‍ය කලාවන් සඳහා එතරම් අවකාශයක් ලබා නොදෙයි.
ලක්ෂණ - අලංකාරික, ජනප්‍රිය හා නිර්මාණාත්මක ගුණාංග මත රඳා පැවතීම.
නව්‍යතාව (Newness) සඵලදායි බව (usefulness) අපූර්ව බව (Original) යන තත්ත්වයන් පිළිබඳව සැළකිලිමත් වෙයි.
නිර්මාණශීලීත්වය හා ග්‍රාහකයා කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ පිරික්සයි.
පිරිවැය, නම්‍යශීලීභාවය, ඵලදායී තෝරා ගැනීම යන සාධක කෙරෙහි අවධානය යොමු කරයි.
කරුණු 2 ක් විස්තර කිරීමට ල.4 (2+4 = 6)

(iv) අ ස්ව කේන්ද්‍රය යනු පුද්ගලයෙකුගේ ශක්තිය සහ ඔහුගේ ඉලක්ක ජය ගැනීම සඳහා ගොඩ නගා ගන්නා සැලසුමයි. ස්ව කේන්ද්‍රය සකස් වන්නේ පුද්ගලයා ගමන් කරන ඉලක්ක ආශ්‍රයෙනි. මෙම ඉලක්ක පුද්ගලයාගේ අරමුණු ඉටු කර ගැනීමේ තොරතුරුයි.

ආ ප්‍රගීත්ගේ ස්වකේන්ද්‍රය දුවර්ල වී තිබේ. අවසාන ඉලක්කය කරා ඔහු ගමන් කරවන බලය දුර්වල වී තිබේ ඔහු උසස් පෙළ විභාගය ජය ගැනීම යන ඉලක්කය සඳහා කායික මානසික බලය නොයොදවයි. ඔහු විවිධ මාධ්‍ය හරහා විනෝදාස්වාදය සපයා ගනිමින් පාසල් අධ්‍යාපනය ගැන නොතකයි. මෙවැනි තත්ත්වයක් යටතේ ඔහු පාලනය කිරීමට මාධ්‍යයට වැඩි ඉඩක් ලැබෙයි. මාධ්‍ය සපයන තොරතුරුවල බලපෑමට ඔහු යටත් වෙයි. මෙසේ ඔහුගේ ස්ව කේන්ද්‍රය දුර්වල වී තිබේ.

ඇ යමෙකුගේ ස්වකේන්ද්‍රය (ස්ව පථය) විඥානික සහ අවිඥානික යන ක්‍රම දෙකම ක්‍රියාත්මක වෙයි. ප්‍රගීත්ගේ ස්වකේන්ද්‍රය අවිඥානිකව ක්‍රියාත්මක වීමක් සිදුවන නිසා ඔහුට ඔහු ගන්නා තිරණ සහ නිගමන පාලනය කිරීමට නොහැකි වෙයි. ඔහුගේ සම්පූර්ණ අනුදැනුමෙන් තොරව අධ්‍යාපන කටයුතුවලින් බැහැරව ඉලක්කය ව්‍යයවර්ථ කරවන මාධ්‍යයන්ට වහල්වීමට සිදුවෙයි.

ඇ ප්‍රගීත්ට ස්ව කේන්ද්‍රය ශක්තිමත් කර ගැනීමට හැකිය. සවිඥානිකව ස්වකේන්ද්‍රය හැසිරවීමට උත්සාහ කළ යුතුය. මාධ්‍ය සන්දේශවල ක්‍රියාවලිය හඳුනාගැනීමෙනුත් තමාට ඉලක්කය සඳහා තොරතුරු පමණක් තෝරාබේරාගෙන තමන් පාලනය කර ගැනීමෙනුත් නිෂ්ඵල ගුණාත්මකභාවයෙන් අඩු මාධ්‍යයන්ගෙන් ආරක්ෂාවී ඒවායේ බලපෑමෙන් මිදී මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය කර ගැනීමෙනුත් ස්ව කේන්ද්‍රය ශක්තිමත් කර ගැනීමට හැකිවේ. **ල. 08**

(එකතුව = 20)

06. (i) * මාධ්‍ය සාක්ෂරතා ඥානයෙන් ද විචාරශීලී චින්තනයෙන් ද නිර්මාණශිලී චින්තනයෙන් ද දරුවන් බලසම්පන්න කළ යුතු බව. 2. පෙර පාසල් වයසේ සිට මාධ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතු බව. (ල. 2)

(ii) * ක්‍රම
නව භාණ්ඩයක් හෝ සේවාවක් හඳුන්වා දීම, තරඟකාරීත්වයක් පවතින අවස්ථාවක ඇති වන ප්‍රතිවිරෝධය ජය ගැනීම. , පාර්ශවකරුවන් අතර ඇතිවන මතභේදාත්මක තත්ත්ව සමනය කිරීම, අයහපත්, ව්‍යාජ ප්‍රසිද්ධියක් මත ප්‍රතිරූපයට සිදුවන හානිය අවම කිරීම.
උපක්‍රම
වෙළඳ මට්ටම් ලබා දීම, විශේෂ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම, ආයතනික සමාජ වගකීම්, ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම, මාධ්‍ය ප්‍රදර්ශන පැවැත්වීම, මාධ්‍ය සම්බන්ධතා පැවැත්වීම, අනුග්‍රාහකත්වය ලබා දීම.
(ල. 2)

(iii) 'සන්දර්භානුගතයි'' යනු අදාළ සන්නිවේදනය සිදුවන වටපිටාවයි. ඕනෑම අවස්ථාවක සන්නිවේදනය සිදුවන්නේ පරිසරයට යෝග්‍ය ආකාරයෙන් ය. එය පුද්ගලයන් අනුව අවස්ථාව අනුව, වෘත්තීන් අනුව, සංස්කෘතිය අනුව වෙනස් අයුරින් භාවිතා කෙරේ.
උදා: මංගල අවස්ථාවක, අවමංගල අවස්ථාවක, පුද්ගලයෙකු කෝප ගැන්වූ විට, භාවිතා වන සන්නිවේදනය එකිනෙකට වෙනස් වීම.
විවිධ වෘත්තීන් අනුව - එනම් ඉහළ නිළධාරීන් අතර, කම්කරු, කුලී වැඩ කරන පුද්ගලයන් අතර, ධීවර, පතල් කර්මාන්ත ආශ්‍රිතව භාවිතා වන සන්නිවේදනය එකිනෙකින් වෙනස් වීම.
විවිධ සංස්කෘතීන් අතර භාවිතා වන සන්නිවේදනය වෙනස් විටම, බෞද්ධාගම තුළ පැන්, වළඳනවා, දානය ආදී වදන් භාවිතා වීම

විවිධ සමාජ කණ්ඩායම් අතර - එනම් විශ්වවිද්‍යාල, ආදිවාසීන් අතර ප්‍රාදේශීය වශයෙන් භාවිතා වන සන්නිවේදනය වෙනස් වීම.

(iv) පොදු ජනතාවට එල්ල වන විවිධාකාර තර්ජනයන් කෙරෙහි මාධ්‍ය මඟින් විමසිලිමත් වීම සහ ඊට එරෙහිව හඬ නැඟීම මෙහි අදහසයි. සමාජ ක්‍රියාවලියේ දී පාලකයෝ අත්තනෝමතිකව ක්‍රියා කරන අවස්ථාවල සමාජයට සිදුවන හානිය වළක්වා ගැනීමට සමාජ ශක්තියෙන් යුතුව ජනමාධ්‍ය ක්‍රියා කළ යුතුය. (හැඳින්වීමට - 04)

උදාහරණ

1. විශ්ව විද්‍යාල ශිෂ්‍ය ගැටලු නොවිසඳන අවස්ථාවල හා උද්ඝෝෂණය කරන අවස්ථා මර්දනය කරන විට මාධ්‍ය පෙනී සිටීම.
2. වෘත්තීය ගැටලු, නිරන්තර මිල මට්ටම් ඉහළ යාම,
   ජීවන වියදම් ඉහළ යාම, නීතිමය හා සමාජ ගැටලු ඉදිරිපත් කරන සාධාරණ අවස්ථාවල මාධ්‍ය පෙනී සිටීම යනාදී උදාහරණ හතරක් සඳහා ලකුණු 4 ක් ලබා දෙන්න.

07. (i) සුපරීක්ෂණය , අර්ථකථනය , සහසම්බන්ධය , සමාජානුයෝජනය (ල. 2)

(ii) අරමුණ පැහැදිලිද

ප්‍රධාන සංදේශය පැහැදිලි ද

අරමුණ වනුයේ දැනුම් දීම, ඒත්තු ගැන්වීම, විනෝදවීම යනාදිය යි. අරමුණ දැන ගැනීමෙන් ප්‍රධාන සංදේශයේ දී ඇති තොරතුරු හා සංවිධානය ගැන ඇඟවීමක් සිදු වේ. ඒ අනුව ප්‍රධාන සංදේශයෙන් කියවෙන දෙයහි මතුපිට සහ අභ්‍යන්තර අර්ථය වටහා ගත හැකිවේ. (ල. 4)

(iii) ජන සංස්කෘතිය

සම්භාව්‍ය සංස්කෘතිය (නම් කිරීමට - 2 / විස්තර කිරීමට 4)

(iv) නොගැඹුරු වීම, සරල වීම, මහා පරිමාණිකව නිෂ්පාදනය සිදු වීම, සියලු දෙනාටම සමීප වීම, වාණිජකරණය මත රැඳී පැවතීම, කල්පවත්නා ස්වභාවයක් දක්නට නොමැති වීම, ජනමාධ්‍ය මත ව්‍යාප්ත වීම, සෑම සමාජ පන්තියක්ම ආකර්ෂණය කර ගැනීම.

(නම් කිරීමට - ල.2, විස්තර කිරීමට 6 )

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440